සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

29 S I

**තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019**

**Third Term Test - Grade 12 - 2019**

විභාග අංකය .............................

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

කාලය පැය දෙකයි

- **අංක 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරා නියමිත අංකයේ කතිරයක් (x) යොදන්න.**

01. ''උපකරණ, පාරිභෝගික ද්‍රව්‍යය, විවිධ සමාජීය සමූහයන්ගේ ව්‍යුහමය ලක්ෂණ මානව සංකල්පනා, ශිල්ප, විශ්වාස හා චාරිත්‍රයන්ගෙන් අනුබද්ධ සමස්ථයයි.'' සංස්කෘතිය පිළිබඳ මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,
    1. ඊ.බී. ටයිලර්
    2. බී. මැලිනොව්ස්කි
    3. රැල්ෆ් ලින්ටන්
    4. විල්බර් ශ්‍රාම්
    5. ජෝන් ඩුවී

02. උත්තරීතර වූ ද පූජනීය වූ ද පාරිශුද්ධ වූ ද ජීවන ක්‍රියාකාරිත්වයේ සංවිධාන ප්‍රභේදයකි.
    1. සම්භාව්‍ය සංස්කෘතිය
    2. ජනප්‍රිය සංස්කෘතිය
    3. සාම්ප්‍රදායික සංස්කෘතිය
    4. මාධ්‍ය සංස්කෘතිය
    5. ගෝලීය සංස්කෘතිය

03. මාධ්‍ය සාක්ෂරතාවේ තෙවැදෑරුම් සිද්ධාන්තවලට අයත් වන්නේ,
    1. ස්ව කේන්ද්‍රය, ඥාන ව්‍යුහ හා කුසලතා ය.
    2. ස්ව කේන්ද්‍රය, ආකල්ප හා කුසලතා ය.
    3. බල කේන්ද්‍රය, ස්ව පථය හා කුසලතා ය.
    4. ස්ව කේන්ද්‍රය, ස්ව පථය හා බල කේන්ද්‍රණය.
    5. ඥාන ව්‍යුහ, බල කේන්ද්‍රණය හා ස්ව පථය.

04. සාම්ප්‍රදායික සමාජයෙහි මූලික සහ ආධිපත්‍යයික සංස්කෘතිය,
    1. සම්භාව්‍ය සංස්කෘතියයි.
    2. ජන සංස්කෘතියයි.
    3. ජනප්‍රිය සංස්කෘතියයි.
    4. බහුජන සංස්කෘතියයි.
    5. ගෝලීය සංස්කෘතියයි.

05. පුද්ගල මනසක තැම්පත්වී ඇති සැකසුණු තොරතුරු කට්ටලය,
    1. ස්ව පථයයි.
    2. කුසලතාවයි.
    3. පුද්ගල හැකියාවයි.
    4. ඥාන ව්‍යුහයයි.
    5. බල කේන්ද්‍රණයයි.

06. මාධ්‍ය විචාරයට මඟ පෙන්වන ප්‍රධාන දෘෂ්ටිවාද ලෙස සැලකිය හැක්කේ,
    1. මාක්ස්වාදී විචාරය, ස්ත්‍රීවාදී විචාරය හා සෞන්දර්යාත්මක විචාරයයි.
    2. මාක්ස්වාදී විචාරය, මනෝ විශ්ලේෂණවාදී විචාරය හා දේශපාලන විචාරයයි.
    3. සංසන්දනාත්මක විචාරය, ස්ත්‍රීවාදී විචාරය හා මාක්ස්වාදී විචාරයයි.
    4. මනෝ විශ්ලේෂණවාදී විචාරය, මාක්ස්වාදී විචාරය හා භාෂාත්මක විචාරයයි.
    5. මාක්ස්වාදී විචාරය, මනෝ විශ්ලේෂණවාදී විචාරය හා ස්ත්‍රීවාදී විචාරයයි.

07. ''අප වෙත ලැබෙන මාධ්‍ය සංදේශ අර්ථ කථනය කර ගැනීමට හා අප කෙතරම් දුරට මාධ්‍යයට විවෘත ද යන්න පිළිබඳ පර්යාලෝකය මාධ්‍ය සාක්ෂරතාවයි. මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,

1. යුරෝපා කොමිසම
2. එඩ්වඩ් ටයිලර්
3. ඩබ්ලිව්. ජේම්ස් පෝටර්
4. ඇමරිකානු ජාතික මාධ්‍ය සාක්ෂරතා ආයතනය
5. යුනෙස්කෝ සංවිධානය

08. මානව වර්ගයාගේ සංස්කෘතික පරිණාමයේ මෑතකදී බිහිවූ නවතම සංස්කෘතික ප්‍රභේදය වන්නේ,

1. මාධ්‍ය සංස්කෘතියයි
2. ජනප්‍රිය සංස්කෘතියයි
3. ගෝලීය සංස්කෘතියයි
4. සම්භාව්‍ය සංස්කෘතියයි
5. බහුජන සංස්කෘතියයි

09. 20 වන සියවසෙහි මාධ්‍ය සංස්කෘතිය සඳහා අවශ්‍ය වූ සංකල්පීය පදනම නිර්මාණය කළ එක් පුරෝගාමියෙකු බවට පත් වූයේ,

1. වෝල්ටර් ලිප්මාන් ය.
2. වොල්ටර් බෙන්ජැමින් ය.
3. ඩබ්ලිව්. ජේම්ස් පෝටර් ය.
4. ඊ.බී. ටයිලර්ය.
5. විල්බර් ශ්‍රාම් ය.

10. යුරෝපා කොමිසමේ අර්ථ කථනයට අනුව මාධ්‍ය සාක්ෂරතාවේ මූලික නිපුණතාවන්ට අයත් **නොවන්නේ,**

1. පරිහරණය කිරීමේ කුසලතාව
2. විශ්ලේෂණය කිරීමේ කුසලතාව
3. ඇගයීමේ කුසලතාව
4. නිර්මාණය කිරීමේ කුසලතාව
5. විග්‍රහ කිරීමේ කුසලතාව

11. සංදේශයක් තුළ ඇතුලත්වී ඇති තොරතුරු වර්ග දෙක වනුයේ,

1. තත්‍ය තොරතුරු හා සමාජීය තොරතුරුය.
2. සත්‍ය තොරතුරු හා අසත්‍ය තොරතුරුය.
3. යථා තොරතුරු සහ අව්‍යීමත් තොරතුරුය.
4. ජන මාධ්‍ය තොරතුරු හා අවට පරිසරයෙන් ලැබෙන තොරතුරුය.
5. රාජ්‍ය තොරතුරු හා රාජ්‍ය නොවන තොරතුරුය.

12. **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.

1. වෙළඳ දැන්වීම්වල පෙළ හා රූප මඟින් මිථ්‍යාව ජනනය කරයි.
2. සංස්කෘතික අවබෝධය මාධ්‍ය විචාරයට අත්‍යාවශ්‍ය වේ.
3. මාධ්‍ය ආර්ථිකය යනු පසුගිය වසර 40 පුරා සැලකිය යුතු වර්ධනයකට ලක්වී ඇති අධ්‍යයන ක්ෂේත්‍රයකි.
4. සංදේශයක පෙළ හා මූලාශ්‍රය පමණක් විචාරයට ලක් කිරීමෙන් එහි ස්වභාවය හඳුනාගැනීමය.
5. මාධ්‍ය සංදේශ, නිර්මාණකරුවන්ගේ වටිනාකම් සහ මත පිළිබිඹු කරයි.

13. ''ජන සංස්කෘතිය'' යන පාරිභාෂිතය ප්‍රථමයෙන් භාවිත කළ 1957 ලිපි සංග්‍රහය සම්පාදනය කරන ලද්දේ,

1. එඩ්වඩ් ටයිලර් සහ බර්නාඩ් රොසෙන්බර්ග් ය.
2. ඩේවිඩ් වයිට් සහ බර්නාඩ් රොසෙන්බර්ග් ය.
3. විල්බර් ශ්‍රාම් සහ ඩේවිඩ් වයිට්ය.
4. එඩ්වඩ් ටයිලර් සහ වෝල්ටර් බෙන්ජැමින්ය.
5. ඊ.බී. ටයිලර් සහ ඩේවිඩ් වයිට්ය.

14. ජන සන්නිවේදන ක්‍රියාවලියේ මුල්ම වාහකයා ලෙස හැඳින්වෙන්නේ,

1. ගුවන්විදුලිය
2. කැමරාව
3. පුවත්පත
4. රූපවාහිනිය
5. අන්තර්ජාලය

15. ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණයක් **නොවන්නේ,**

1. එය නොගැඹුරු වීම.
2. එය සරල වීම.
3. එය මහා පරිමාණිකව නිෂ්පාදනය වීම.
4. වැඩිහිටියන් හා ළමුන්හට අදාල නොවීම.
5. සියළු දෙනාට සමීප වීම.

16. ඥාන ව්‍යුහයන් ගොඩනගා ගැනීමට අතිශයින් ඉවහල්වන මූලික ද්‍රව්‍ය

1. තොරතුරු වේ.
2. දැනුම වේ.
3. කුසලතා වේ.
4. ආකල්ප වේ.
5. විඥාපන ද්‍රව්‍ය වේ.

17. සන්නිවේදනයේ ස්වභාවයක් **නොවන්නේ,**

1. අරමුණු සහගත බව.
2. ක්‍රියාපටිපාටියක් බව.
3. බලය වන බව.
4. සන්දර්භානුගත බව.
5. මානව සමාජයේ පැවැත්ම බව.

18. ස්ත්‍රීවාදී විචාර වාදය මතුකරන මූලික පදනම වන්නේ,

1. ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳව ලිංගිකත්ව සමානාත්මතා පදනම මත විචාරය කිරීමයි.
2. පොදු මානව අයිතිවාසිකම් පිළිබඳව විචාරය කිරීමයි.
3. සමාජයේ කාන්තා අයිතිවාසිකම් අවප්‍රමාණය වීම පිළිබඳ විචාරය කිරීමයි.
4. කාන්තා මූලික සමාජයක් උපකල්පනය කරමින් විචාරය කිරීමයි.
5. ගැහැනිය ඒකාකෘතික ලෙස නිරූපනය කෙරෙන සංදේශ පිළිබඳ විචාරය කිරීමයි.

19. සාමාන්‍ය ව්‍යවහාරයේ දී මූලික ජන මාධ්‍ය ලෙස හැඳින්වෙන්නේ,

1. රූපවාහිනිය, පුවත්පත හා අන්තර්ජාලය
2. ගුවන් විදුලිය, පුවත්පත හා සමාජ ජාල
3. රූපවාහිනිය, ගුවන් විදුලිය හා පුවත්පත
4. සමාජ ජාල, අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල්
5. ගුවන් විදුලිය, පුවත්පත් හා සඟරා

20. විචාරශීලි ග්‍රාහකයෙකු සතු කුසලතාවයක් **නොවන්නේ,**

1. විශ්ලේෂණය
2. තක්සේරුකරණය
3. කාණ්ඩකරණය
4. අනුමානය
5. පරීක්ෂණය

21. මාධ්‍ය විචාරයේ දී විශ්ලේෂණය යනු,

1. සංදේශයක් කියවා තේරුම් ගැනීමයි.
2. සංදේශයක් තේරුම්ගත හැකි ආකාරයෙන් එය කොටස්වලට වෙන් කර ගැනීමයි.
3. සංදේශය පිළිබඳ යමක් නිගමනය කිරීමයි.
4. සංදේශයේ සමස්ථ අර්ථය කෙටියෙන් පැහැදිලි කිරීමයි.
5. සංදේශයක අන්තර්ගතය පිළිබඳ අනුමාන කිරීමයි.

22. තොරතුරක යෝග්‍යතාව හෝ අයෝග්‍යතාව මැන බැලෙන්නේ,

1. නිගමනය තුලින්ය.
2. විශ්ලේෂණය තුලින්ය.
3. අනුමානය තුලින්ය.
4. තක්සේරුකරණය තුලින්ය.
5. කාණ්ඩකරණය තුලින්ය.

23. අභිප්‍රේරණයේ ප්‍රධාන මානයන් තුන වනුයේ,

1. ආකල්ප වෙනස් කිරීම, හැසිරීම් වෙනස් කිරීම හා මතවාද වෙනස් කිරීමය.
2. ආකල්ප වෙනස් කිරීම, හැසිරීම් වෙනස් කිරීම හා කාලයත් සමග වෙනස් කිරීමය.
3. හැසිරීම් වෙනස් කිරීම, ආකල්ප වෙනස් කිරීම හා සමාජ සම්මතයන් වෙනස් කිරීම ය.
4. සංස්කෘතික වෙනස්කම්, ආකල්ප වෙනස් කිරීම් හා කාලයත් සමග වෙනස් කිරීම් ය.
5. සංකල්ප වෙනස් කිරීම, ආකල්ප වෙනස් කිරීම හා හැසිරීම් වෙනස් කිරීමය.

24. මාධ්‍ය විචාරය තුළ විශ්වාසනීයත්වය සඳහා විශ්ලේෂණ ප්‍රවේශ දෙක වනුයේ,

1. ප්‍රාථමික මාන හා ද්විතික මාන ය.
2. ප්‍රාථමික මාන හා තෘතියික මාන ය.
3. ඒක මාන හා ද්වි මාන ය.
4. ප්‍රාථමික මාන හා බහුමාන ය.
5. ද්වීතික මාන හා තෘතික මාන ය.

25. ඵලදායි සංදේශයක ප්‍රධාන ගුණාංග හතර වනුයේ,
   1. සරල බව, විශේෂත්වය, ව්‍යුහය හා ආකල්ප
   2. සරල බව, ව්‍යුහය, විශේෂත්වය හා දැනුම
   3. සරල බව, විශේෂත්වය, ව්‍යුහය හා ඇලීම
   4. සරල බව, ව්‍යුහය, ආකල්ප හා චර්යා
   5. සරල බව, අරමුණ, ව්‍යුහය හා ඇලීම

26. සංදේශය ශුර මෙහෙයවීමට සංදේශයේ අංග වෙනස් කිරීමට බලපාන ප්‍රාථමික සංරචකවලට අයත් **නොවන්නේ,**
   1. ප්‍රමාණය
   2. ගුණාත්මක භාවය
   3. සම්බන්ධතාව
   4. සරල බව
   5. ආකාරය

27. ආකේතකරය, අර්ථ නිරූපක, සංදේශය, විකේතකරය යන ලක්‍ෂණ දක්නට ලැබෙනුයේ,
   1. ඩේවිඩ් කේ. බර්ලෝ ආකෘතිය තුළය.
   2. ඔස්ගුඩ් ශ්‍රාම් ආකෘතිය තුළය.
   3. ඇරිස්ටෝටල් ආකෘතිය තුළය.
   4. ශැනෝන් වීවර් ආකෘතිය තුළය.
   5. හැරල්ඩ් ඩී ලැස්වෙල් ආකෘතිය තුළය.

28. ''ජනතාව හා ඔවුන්ගේ ගැටළු'' කෘතිය රචනා කරන ලද්දේ,
   1. චාල්ස් කුලී ය.
   2. වෝල්ටර් ලිප්මාන් ය.
   3. ජෝන් ඩුවී ය.
   4. විල්බර් ශ්‍රාම් ය.
   5. වොරන් වීවර් ය.

29. අංකිත තාක්‍ෂණික මාධ්‍ය මෙවලම් සමාජ භාවිතයට පැමිණෙන්නේ,
   1. 80 සහ 90 දශක වලය.
   2. 50 සහ 60 දශක වලය.
   3. 30 සහ 40 දශක වලය.
   4. 2000 සහ 2010 දශක වලය.
   5. 50 දශකයට පෙර සිටය.

30. උසස් පෙළ කලා විෂය ධාරාවට ''සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය'' විෂය ඇතුලත් වන්නේ,
   1. 2006 වසරේදීය.
   2. 2007 වසරේදීය.
   3. 2008 වසරේදීය.
   4. 2011 වසරේදීය.
   5. 2012 වසරේදීය.

31. යුනෙස්කෝ සංවිධානය ගෘන්වල්ට් ප්‍රකාශය ඉදිරිපත් කරන ලද්දේ,
   1. 1985 වසරේදීය.
   2. 1990 වසරේදීය.
   3. 1978 වසරේදීය.
   4. 1960 වසරේදීය.
   5. 1982 වසරේදීය.

32. සිංහලයේ සන්නිවේදනය යන වචනයෙහි අර්ථය,
   1. දැනගත් දේ දැන ගැනීමට සැලැස්වීම.
   2. මැනවින් දැනුම් දීම.
   3. තොරතුරු දැන ගැනීම.
   4. තොරතුරු හුවමාරුව.
   5. පොදු බවට පත් කිරීම වේ.

33. නිරීක්‍ෂණය කල හැකි ආකාරයේ ප්‍රතිචාරය,
   1. බලපෑම
   2. ආකේතීකරණය
   3. විකේතීකරණය
   4. ප්‍රතිපෝෂණය
   5. අත්දැකීම් පසුතලය වේ

34. යම් සන්නිවේදන ක්‍රියාවලියක් සිදුවන්නා වූ වටපිටාව හැඳින්වෙන්නේ,
   1. අත්දැකීම් පසුතලය ලෙසය.
   2. සන්දර්භය ලෙසය.
   3. බලපෑම ලෙසය.
   4. ප්‍රතිචාර ලෙසය.
   5. ප්‍රතිපෝෂණය ලෙසය.

35. අදහස, දැනුම යනාදිය භාෂණය හෝ ලේඛනය හෝ සංඥා මඟින් ප්‍රදානය කිරීම, ප්‍රකාශ කිරීම හෝ හුවමාරු කිරීම සන්නිවේදනයයි. මෙය,
    1. චාල්ස් කූලීගේ නිර්වචනයයි.
    2. විල්බර් ශ්‍රාම් ගේ නිර්වචනයයි.
    3. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ නිර්වචනයයි.
    4. හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ නිර්වචනයයි.
    5. ෂැනෝන් සහ වීවර්ගේ නිර්වචනයයි.

36. ජන මාධ්‍යයේ මූලික කාර්යයන් හතරට අයත් **නොවන්නේ,**
    1. සුපරීක්ෂණය
    2. අර්ථකථනය
    3. සහ සම්බන්ධය
    4. සමාජානුයෝජනය
    5. තොරතුරු හුවමාරුව

37. ''සංජානනය''
    1. අන්තර් පුද්ගල සන්නිවේදනයේ මූලිකාංගයකි.
    2. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ මූලිකාංගයකි.
    3. සමූහ සන්නිවේදනයේ මූලිකාංගයකි.
    4. ජන සන්නිවේදනයේ මූලිකාංගයකි.
    5. අථත්‍ය සන්නිවේදනයේ මූලිකාංගයකි.

38. අන්තර් පුද්ගල සන්නිවේදනයේ දෙආකාර ස්වරූපය,
    1. මුහුණට මුහණලා සහ යන්ත්‍ර සහයක සන්නිවේදනය වේ.
    2. යන්ත්‍ර සහායක සහ අන්තර්ජාල භාවිතයෙන් සිදුවන සන්නිවේදනය වේ.
    3. මනස තුළ සිදුවන සහ මනසින් පරිබාහිරව සිදුවන සන්නිවේදනය වේ.
    4. ජන මාධ්‍ය භාවිතයෙන් සහ මුහුණට මුහුණ ලා සිදුවන සන්නිවේදනය වේ.
    5. අන්තර්ජාලය සහ කෙටි පණිවිඩ හුවමාරුව තුළින් සිදුවන සන්නිවේදනය වේ.

39. මහජන සන්නිවේදනය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
    1. සමීප සන්නිවේදන කාර්යයක් සිදු නොවේ.
    2. ප්‍රතිපෝෂණය සීමා සහිත වේ.
    3. සියලු දෙනාගේ අවධානය දිනාගත හැකිවේ.
    4. බොහෝවිට පොදු ස්ථානවල දක්නට ලැබේ.
    5. සංදේශය ග්‍රාහකගත කිරීමට බොහෝ අවස්ථාවල තාක්ෂණික මෙවලම් ද භාවිතා වේ.

40. Hub ආකෘතියේ 05 වන පියවරේ දී දක්නට ලැබෙන්නේ,
    1. දොරටු පාලකයෝ
    2. නියාමකයෝ
    3. ග්‍රාහක ක්ෂේත්‍ර
    4. බලපෑම්
    5. පෙරහනු

41. Hub ආකෘතිය තුල බලපෑමේ දෙආකාර ස්වරූපය වනුයේ,
    1. සමාජය හා පුද්ගලයා කෙරෙහි බලපෑම.
    2. පුද්ගලයා හා පවුල කෙරෙහි බලෑපම.
    3. සමාජය හා ජාත්‍යන්තරය කෙරෙහි බලපෑම.
    4. මනස හා චර්යාව කෙරෙහි බලපෑම.
    5. මිනිසා හා සමස්ථ සමාජයේ සිදුවීම් කෙරහි බලපෑම වේ.

42. ''කිසියම් කරුණක් සම්බන්ධයෙන් වැඩි අවධාරිත බලයක් මාධ්‍යගත කිරීම.''
    1. මාධ්‍ය විකෘතිය හා සෝෂාවයි.
    2. බලපෑමයි.
    3. ප්‍රතිපෝෂණයයි.
    4. පෙරහනු භාවිතයයි.
    5. මාධ්‍ය විස්තාරණයයි.

43. අථත්‍ය සන්නිවේදනයේ විශේෂතාවයක් **නොවන්නේ,**
    1. කාර්යක්ෂම බව
    2. අඩු පිරිවැය
    3. ආරක්ෂිත බව
    4. භෞතික වශයෙන් ඉඩකඩ අවශ්‍ය නොවීම
    5. ඕනෑම විද්‍යුත් උපකරණයක් භාවිත හැකියාව

44. හැරල්ඩ්.ඩී. ලැස්වෙල් ආකෘතියේ මූලිකාංග,
1. 3 කි. 2. 4 කි. 3. 6 කි. 4. 5 කි. 5. 7 කි.

45. තාක්ෂණික දෘෂ්ටි කෝණයකින් සන්නිවේදන ක්‍රියාවලිය විමසා බැලෙනුයේ,
1. ඔස්ගුඩ් ශ්‍රාම් ආකෘතිය තුළය. 2. ෂැනෝන් හා වීවර් ආකෘතිය තුළය.
3. ඇරිස්ටෝටල් ආකෘතිය තුළ ය. 4. Hub ආකෘතිය තුළ ය.
5. ලැස්වෙල් ආකෘතිය තුළ ය.

46. ඒ ඒ සමාජවල ජන විඥානයේ ස්වභාවය නිරූපණය වන්නේ,
1. ජන කවි තුළිනි. 2. ශාන්ති කර්ම හා යාතු කර්ම තුළිනි.
3. ජන කතා තුළිනි. 4. ගැමි නාටක තුළිනි.
5. ජන වෙදකම තුළිනි.

47. දැනුම් ඉගෙනුම් සම්පාදනය, සංස්කෘතික අංග හුවමාරු කිරීමට හැකිවීම, භාව ප්‍රකාශනය ආදි ලක්ෂණ දක්නට ලැබෙනුයේ,
1. නූතන මාධ්‍ය තුළ ය. 2. ජන මාධ්‍ය තුළ ය.
3. නව මාධ්‍ය තුළ ය. 4. සාම්ප්‍රදායික මාධ්‍ය තුළ ය.
5. බහුජන මාධ්‍ය තුළ ය.

48. ''එදිනෙදා ජීවිතයට අවශ්‍ය තොරතුරු සහිත යම් නිශ්චිත කාල වකවානුවක අඛණ්ඩව ප්‍රකාශයට පත්කරන, එකට බඳින ලද ප්‍රකාශයකි.'' සඟරා පිළිබඳ මෙම ප්‍රකාශය
1. එක්සත් ජාතීන්ගේ අර්ථකථනය යි.
2. යුනෙස්කෝ සංවිධානයේ අර්ථකථනය යි.
3. ගෘෘන්වල්ට් ප්‍රකාශය යි.
4. සිංහල ශබ්ද කෝෂයේ අර්ථකථනය යි.
5. ''සුමංගල'' ශබ්ද කෝෂයේ අර්ථකථනය යි.

49. නව මාධ්‍යවල දක්නට ලැබෙන ලක්ෂණයක් **නොවන්නේ,**
1. අංකිතකරණය 2. ජාලගතකරණය 3. අන්තර් ක්‍රියාකාරිත්වය
4. අධි පාඨනීයත්වය 5. නාමකරණය

50. Pinterest යනු,
1. නූතන මාධ්‍ය ප්‍රභේදයකි. 2. සමාජ මාධ්‍ය ප්‍රභේදයකි.
3. ජන මාධ්‍ය ප්‍රභේදයකි. 4. සාම්ප්‍රදායික මාධ්‍ය ප්‍රභේදයකි.
5. අන්තර්ජාල තොරතුරු හුවමාරුවකි.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

**29 S II**

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

## ThirdTerm Test - Grade 12 - 2019

විභාග අංකය .............................

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

කාලය පැය තුනයි

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) ජන මාධ්‍ය පිළිබඳව ඩිෆ්ලුවර් හා ඩෙනිස් නිර්වචනය දක්වන්න. (ල. 2)
    (ii) සන්නිවේදන ක්‍රියාවලිය තුළ ''සන්නිවේදකයා'' හා සෘජු සම්බන්ධතාවයක් ඇති මූලිකාංග 04ක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)
    (iii) දෙවන ලෝක යුධ සමයෙන් පසු ''ජන මාධ්‍ය'' යන සංකල්පය සංවර්ධනය වීමට හේතු වූ කරුණු 3ක් පිළිබඳව විග්‍රහ කරන්න. (ල. 6)
    (iv) 21 වන සියවස සඳහා සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යාපනය හැදෑරීමේ වැදගත්කම කරුණු 4ක් පදනම් කර ගනිමින් ලිපියක් පාසල් ජන මාධ්‍ය සඟරාවේ පළ කිරීමට සුදුසු ලෙස සකස් කරන්න. (ල. 8)

02. (i) සමූහ සන්නිවේදනයේ දී සන්නිවේදකයාට ඉවහල් කරගත හැකි ක්‍රම හතරක් දක්වන්න. (ල. 2)
    (ii) විධිමත් සන්නිවේදනය හා අවිධිමත් සන්නිවේදනය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)
    (iii) කෙටි සටහන් ලියන්න.
        a. ජාලගතකරණය
        b. ජන සන්නිවේදන විකාශයේ කාල රේඛාව
        c. රූපවාහිනී මාධ්‍යයේ මූලික ලක්ෂණ (ල. 6)
    (iv) සාම්ප්‍රදායික මාධ්‍ය විධි ක්‍රම හතරක් දක්වා ඉන් දෙකක් පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 8)

03. (i) සමාජ මාධ්‍ය ජාල හතරක් දක්වන්න. (ල. 2)
    (ii) නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය කාර්යභාරයන් හතරක් දක්වා, ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)
    (iii) සන්නිවේදනය පිළිබඳ හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය දක්වා එහි විශේෂතා 03ක් දක්වන්න. (ල. 6)
    (iv) වර්තමාන සමාජ ජාල ක්‍රියාකාරීත්වය සමාජය මත ඇති කරන අයහපත් බලපෑම් පිළිබඳව කරුණු 04ක් ඇසුරින් විග්‍රහ කරන්න. (ල. 8)

04. (i) සංස්කෘතික ප්‍රභේද හතරක් දක්වන්න. (ල. 2)
    (ii) උසස් මාධ්‍ය සාක්ෂරතාවක් ඇති කර ගැනීමෙන් පුද්ගලයාට අත්පත්වන ප්‍රයෝජන 04ක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)
    (iii) මාධ්‍ය සාක්ෂරතාවේ තෙවැදෑරුම් සිද්ධාන්ත පැහැදිලි කරන්න. (ල. 6)
    (iv) අන්තර් සංස්කෘතික අධ්‍යයනය සමාජයකට වැදගත්වන ආකාරය කරුණු 04ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 8)

05. (i) දෘෂ්‍ය සන්නිවේදන කුසලතා වර්ධනයට හේතුවන කරුණු හතරක් දක්වන්න. (ල. 2)

(ii) ජන මාධ්‍ය වර්ගීකරණය සරලව දක්වන්න. (ල. 4)

(iii) මුද්‍රිත මාධ්‍ය යටතේ ගැනෙන පුවත්පත, පොත් සහ සඟරා පිළිබඳ විස්තර කරන්න. (ල. 6)

(iv) ''අන්තර්ජාල භාවිතය හා තරුණ පරපුර මැයෙන් වචන 250කට නොඅඩු විමර්ශණාත්මක ලිපියක් ඉරුදින පුවත්පතකට සුදුසු ලෙස සකස් කරන්න. (ල. 8)

06. (i) මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ යුරෝපා කොමිසමේ අර්ථකථනය දක්වන්න. (ල. 2)

(ii) විචාරශීලී ග්‍රාහකයෙකු සතු විය යුතු කුසලතා හතරක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) වර්තමානයේ සංඛ්‍යාංක තාක්ෂණය බහුලව භාවිත කරයි. එම තාක්ෂණය භාවිත කරන අවස්ථා තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

(iv) විචාරශීලී ග්‍රාහකත්වය තුලින් අත්වන ප්‍රතිඵල හතරක් විස්තර කරන්න. (ල. 8)

07. (i) මාධ්‍ය සංදේශයක් විශ්ලේෂණය කිරීම සඳහා යොදාගත හැකි මූලික කරුණු හතරක් දක්වන්න. (ල. 2)

(ii) මාධ්‍ය සංදේශ ආධිපත්‍ය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) මාධ්‍ය විචාරය පිළිබඳ පවත්නා දෘෂ්ටිවාද අතුරින් ''මනෝ විශ්ලේෂණ විචාරය'' සහ ස්ත්‍රීවාදී විචාරය'' විස්තර කරන්න. (ල. 6)

(iv) ජන සන්නිවේදනය සතු ලක්ෂණ 04ක් දක්වා ඒවා පිළිබඳව විස්තර කරන්න. (ල. 8)

## තෙවන වාර පරීක්ෂණය - 2019 - 12 ශ්‍රේණිය

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## I කොටස

### පිළිතුරු පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 01. - 2 | 11. - 1 | 21. - 2 | 31. - 5 | 41. - 1 |
| 02. - 3 | 12. - 4 | 22. - 4 | 32. - 2 | 42. - 5 |
| 03. - 1 | 13. - 2 | 23. - 2 | 33. - 4 | 43. - 5 |
| 04. - 2 | 14. - 3 | 24. - 1 | 34. - 2 | 44. - 4 |
| 05. - 4 | 15. - 4 | 25. - 3 | 35. - 3 | 45. - 2 |
| 06. - 5 | 16. - 1 | 26. - 4 | 36. - 5 | 46. - 3 |
| 07. - 3 | 17. - 5 | 27. - 2 | 37. - 2 | 47. - 4 |
| 08. - 1 | 18. - 1 | 28. - 3 | 38. - 1 | 48. - 2 |
| 09. - 2 | 19. - 3 | 29. - 1 | 39. - 3 | 49. - 5 |
| 10. - 5 | 20. - 5 | 30. - 3 | 40. - 2 | 50. - 2 |

## II කොටස - පිළිතුරු

01. (i) ''ජන සන්නිවේදනය සාර්ථක කරගැනීම සඳහා කාලය හෝ දුර අතර පණිවිඩ හුවමාරු කර ගැනීම සඳහා යොදනු ලබන උපාංග ජනමාධ්‍යයි'' **(ඩීෆ්ලුවර් සහ ඩෙනිස්)** (ල. 2)

(ii) * ආකේතකරණය * සංදේශය * නාලිකාව

* ප්‍රතිපෝෂණය යන මූලිකාංග 04 දක්වා තිබීම සහ ඉන් එකක් විස්තර කර තිබීම.

(නම් කිරීම ල : 2 / විස්තර කිරීම ල : 2) (එකතුව ල : 4)

(iii) සන්නිවේදන තාක්‍ෂණයේ සිදු වූ සීඝ්‍ර දියුණුව, යුද්ධයෙන් පසු මාධ්‍ය විනෝදාස්වාදය සඳහා ජනතාව වෙනුවෙන් භාවිතා වීම, හිට්ලර්ගේ ඒකාධිපති පාලන සමය තුළ විද්වතුන් බහුතරයක් ඇමරිකාවට සංක්‍රමණය වීම, වාණිජ පරමාර්ථ සඳහා මාධ්‍ය භාවිතය ආදි කරුණු පිළිබඳව ප්‍රමාණවත් ලෙස විස්තරයක් තිබීම අවශ්‍යය. (ල. 6)

(iv) සන්නිවේදන කුසලතා වර්ධනය, මාධ්‍ය සාක්‍ෂරතාව අත්පත් කර ගැනීම, විචාරශිලී මාධ්‍ය පරිහරණය, අවස්ථාවෝචිත භාෂා භාවිතය, මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ අවබෝධය, මාධ්‍යයේ පුද්ගල හා සමාජ බලපෑම පිළිබඳ දැනුම, තොරතුරු පරිහරණය, මාධ්‍ය ආචාර ධර්ම නිර්මාණශීලි සන්නිවේදන කුසලතා, රැකියා ක්ෂේත්‍රයේ ඉල්ලුම වර්ධනය වීම, මහජන සම්බන්ධතා නිලධාරී තනතුරු ප්‍රවර්ධනය... ආදී වශයෙන් විස්තරාත්මක කරුණු දක්වා තිබීම අවශ්‍යය. (ල. 8) (එකතුව = 20)

02. (i) * පෙර සූදානම * අරමුණු සහගත බව * අවාචික සන්නිවේදන උපක්‍රම භාවිතය


* විවිධ තාක්‍ෂණික උපකරණ හා මෙවලම් භාවිතය
* ප්‍රදීපාගාර උපක්‍රමය .... ආදී වශයෙන් විෂය නිර්දේශයේ 3.1.3 කොටස අසුරින් කරුණු 04ක් දක්වා තිබීම. (ල. 2)

(ii) * සන්නිවේදකයා පැහැදිලිව හඳුනාගත හැකි නිශ්චිත ධූරාවලියක් සහිත ක්‍රියාවලියක් දක්නට ලැබෙන, පියවර ගණනාවක් සහිත සහ නිල වශයෙන් පිළිගත හැකි ක්‍රියාවලියක් .... ආදි වශයෙන් විෂය නිර්දේශයේ 3.1.3 කොටස ඇසුරින් කරුණු 04ක් දක්වා තිබීම.

* මූලාශ්‍රය පැහැදිලිව හඳුනාගත නොහැකි, නිල ස්වභාවයක් නොමැති, ජනතා හැඟීම් ආකල්ප ආදිය සහිත ආදි වශයෙන් අවිධිමත් සන්නිවේදනය විග්‍රහ කර තිබීම. (ල. 4)

(iii) a - තොරතුරු ජාල එකිනෙකට සම්බන්ධ කිරීම ජාලගත කරණයයි. LAN, MAN සහ WAN යන මූලික ජාලගත න්‍යායන් පිළිබඳව ද විශ්ව විසිරි වියමන (World Wide Web) පිළිබඳවද විස්තරයක් තිබීම අවශ්‍ය ය.

b -




c - ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් බව, විචිත්‍ර ආකෘති වලින් සමන්විත බව, පෞද්ගලික ගෘහස්ථ සමීපතාවයකින් යුක්ත බව, ආකර්ෂණීය බව, සංකීර්ණ තාක්‍ෂණයක් සහිත බව, විධිමත් ආයතන ගත සංවිධාන ව්‍යුහයකින් සමන්විත බව, ජාතික හා ජාත්‍යන්තර ලක්‍ෂණවලින් යුක්ත බව.... ආදි වශයෙන් විස්තර කර තිබීම. (ල. 6)

(iv) ජන කථා, ජන කවි, ශාන්ති කර්ම හා යාතු කර්ම, ගැමි නාටක යන විධි ක්‍රම හතර නම් කිරීම. (ල. 2)
ඉහත විධි ක්‍රම වලින් 02ක් පිළිබඳව උදාහරණ සහිතව විස්තර කර තිබීම. (ල. 6)

(එකතුවල . 8)

(එකතුව = 20)

03. (i) Face book, Twitter, Linkedin, Pinterest, Instagram, Skype, Viber, WhatsApp, QQ, WeChat, Q gone, Tumblr, Goollet, Baidu Tiaba, Sinaweibo, Snapchat, V kontakte, Reddit …. ආදි වශයෙන් හතරක් දක්වා තිබීම. (ල. 2)

(ii) තොරතුරු සම්පාදනය, විනෝදාස්වාද සම්පාදනය අධ්‍යාපනය, සමාජානුයෝජනය යන කාර්යයන් හතර දක්වා තිබීම සහ ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කර තිබීම. (ල. 4)

(iii)

කවුද ? → කුමක් කියයි ද ? → කුමන නාලියකින් ද ? → කා හටද? → කුමන බලපෑමක් සඳහා ද ?

* මෙම ආකෘතිය කොටස් 05කින් සමන්විත බව.
* රේඛීය සන්නිවේදන ආකෘතියක් බව
* ප්‍රතිපෝෂණය සහ බාධක පිළිබඳ සඳහන් නොවීම.
* සන්නිවේදනය ක්‍රියාවලියෙහි බලපෑම පිළිබඳව වැඩි අවධානයක් යොමුවීම... ආදී වශයෙන් කරුණු දක්වා තිබීම අවශ්‍යයි. (ල. 6)

(iv)
* ආගමික සංස්කෘතික ගැටුම් ඇතිවීමට මුල් වීම.
* ජන කොටස් අතර අනවබෝධය, අවිශ්වාසය ඇතිවීම.
* ජාත්‍යන්තර ප්‍රජාව තුළ අනවබෝධය හා වැරදි වැටහීම් ඇතිවීම.
* සමාජීය සාමය හා සංහිඳියාව අසත්‍ය තොරතුරු හේතු කොටගෙන බිඳ වැටීම.

ආදි වශයෙන් කරුණු දක්වා තිබීම සහ උදාහරණ සහිතව විස්තර කර තිබීම අවශ්‍යය. (ල. 8)

(එකතුව = 20)

04. (i) * සාම්ප්‍රදායික සංස්කෘතිය * ජන සංස්කෘතිය * සම්භාව්‍ය සංස්කෘතිය * ජනප්‍රිය සංස්කෘතිය * මාධ්‍ය සංස්කෘතිය * ගෝලීය සංස්කෘතිය යන ප්‍රභේදවලින් හතරක් දක්වා තිබීම. (ල. 2)

(ii)
1. විවිධ මාධ්‍ය පණිවිඩ ලබා ගැනීමේ රුචිය වැඩිවීම.
2. අපගේ මානසික චර්යා පද්ධතිය පාලනය කරගැනීමේ හැකියාව.
3. මාධ්‍ය පාලනය කිරීමේ බලයක් ලැබීම.
4. ක්‍රියාශීලි හා විචාරශීලි ග්‍රාහකයෙකු බවට පත්වීම. ආදි වශයෙන් කරුණු 04ක් දක්වා තිබීම සහ ඉන් එකක් පැහැදිලි කර තිබීම අවශ්‍යය. (ල. 4)

(iii) ස්ව කේන්ද්‍රය / ස්ව පථය (Personal Locus) ඥාන ව්‍යුහ (Knowledge Structures) කුසලතා (Skills)

යන සිද්ධාන්ත තුන පැහැදිලි කර තිබීම අවශ්‍යය. (ල. 6)

(iv)
* සීතල යුද්ධය පැවති කාලයේ මෙම සංකල්පය ආරම්භ වූ බව.
* විවිධ සංස්කෘතීන්ට අයත් පාර්ශව සහ සම්බන්ධ කරන පදනම බව.
* ඇතැම් සංස්කෘතීන් උසස් ලෙස සැලකීමටත් ඇතැම් සංස්කෘතීන් පහත් ලෙස සැලකීමටත් මානවයා තුළ ඇති සහජ පුරුද්ද අවම කර ගැනීමට උපකාරිවන බව.
* තාක්ෂණික දියුණුව තුළ සංස්කෘතික සබඳතා සංකීර්ණවීම තුළ බොහෝ සංස්කෘතීන් අධ්‍යයනය කිරීමට මිනිසාට සිදුවීම. ආදි වශයෙන් කරුණු 04ක් ඔස්සේ විග්‍රහ කර තිබීම අවශ්‍යය. (ල. 8)

(එකතුව = 20)

05. (i) රූප මැනවින් දැකීම, රූප හඳුනාගැනීම, අධ්‍යාපනික කාර්යය සඳහා රූප භාවිතයට ගැනීම, දෘෂ්‍ය සන්නිවේදන අංග යොදාගනිමින් නිර්මාණ කිරීම යන කරුණු 04 දක්වා තිබීම.
(ල. 2)

(ii)

ජන මාධ්‍ය

- මුද්‍රිත මාධ්‍ය
  - * පොත්
  - * පුවත්පත්
  - * සඟරා
  - * වාර ප්‍රකාශන
- විද්‍යුත් මාධ්‍ය
  - ගුවන් විදුලිය
  - රූපවාහිනිය

යන ආකාරයට දක්වා තිබීම සඳහා ලකුණු ලබාදිය හැකිය. (ල. 4)

(iii) විෂය නිර්දේශයේ 4.2 විවිධ ජන මාධ්‍ය ප්‍රභේද කොටස යටතේ ජන මාධ්‍ය වර්ගීකරණයට අදාලව පුවත්පත් පොත් සහ සඟරා පිළිබඳව දක්වා ඇති කරුණු ඇසුරින් විස්තර කර තිබීම අවශ්‍යය. (ල. 6)

(iv) අන්තර්ජාල සේවා ඉතිහාසය, ව්‍යාප්තිය හා ලංකාවේ භාවිතය ආරම්භ වීම වර්තමාන ප්‍රවණතා ජංගම දුරකතන හා අන්තර්ජාල භාවිතය විද්‍යුත් තැපැල්, වෙබ් අඩවි, සමාජ ජාල භාවිතය ආදිය පිළිබඳ විස්තර කර තිබීම. තරුණ පරපුර ඒ කෙරෙහි ඇති නැඹුරුව, අධ්‍යාපනය, විනෝදාස්වාද සම්පාදනය, තොරතුරු සම්පාදන හා සමාජනුයෝජනය වැනි යහපත් කාර්යයන් කෙරෙහි තරුණ පරපුරෙහි නැඹුරුව, එහි අහිතකර ප්‍රතිඵල, නොගැලපෙන වෙබ් අඩවි භාවිතය, සයිබර් අපරාධ සමාජ ජාල තුලින් අසභ්‍ය තොරතුරු ප්‍රචාරණය පෞද්ගලිකත්වයට හානි සිදුවීම. සදාචාරාත්මක බිඳ වැටීම් .... ආදි වශයෙන් සමබර විග්‍රහයක් දක්වා තිබීම අවශ්‍යය. (ල. 8)

(එකතුව = 20)

06. (i) මාධ්‍ය සාක්ෂරතාව යනු මාධ්‍යයෙන් සෑම ආකාරයෙන්ම ඉදිරිපත් කරන සංදේශ පරිහරණය කිරීමට, විශ්ලේෂණය කිරීමට, ඇගයුමට හා නිර්මාණ කිරීමට ලබා ගන්නා හැකියාවයි. යුරෝපා කොමිසම (ල. 2)

(ii) විශ්ලේෂණය, තක්සේරුකරණය, කාණ්ඩකරණය, අනුමානය, නිගමනය, සංස්ලේෂණය, වියුක්තිකරණය යන කුසලතා වලින් 4ක් දක්වා තිබීම සහ එයින් එකක් කෙටියෙන් පැහැදිලි කර තිබීම අවශ්‍යය. (ල. 4)

(iii) * මුද්‍රණ කටයුතු වලදී * ඡායාරූපකරණයේ දී
* රූපවාහිනිය වැනි මාධ්‍ය තුලදී * ඔරලෝසුවැනි උපකරණවලදී ආදිය (ල. 6)

(iv) * මාධ්‍ය සංදේශ විනිවිද දැකිය හැකිවීම.
* මාධ්‍ය සංදේශයේ යටිපෙළ අරුත් හඳුනාගත හැකිවීම.
* තමා කල යුතු දේ, නොකල යුතු දේ , අවශ්‍ය, අනවශ්‍යය දේ විචාරශීලිව භාවිත කල හැකිවීම.
* විවිධ ජන මාධ්‍ය දෙස විචාරශීලිව බැලීම හා ඒවා පිටුපස සිටින අදෘශ්‍යමාන බලවේග වටහා ගත හැකිවීම.
* දුරවබෝධ තැන් පැහැදිලිව හඳුනාගත හැකිවීම... ආදී වශයෙන් කරුණු දක්වා තිබීම. (ල. 8)

(එකතුව = 20)

07. (i) අර්ථය, අදාළ බව, පෙළඹවීම, පක්ෂපාතීත්වය, විශ්වාසනීයත්වය, විකෘතිකරණය, සඵලතාව ශුර මෙහෙයවීම, ඒකාකෘතික බව, ඇගයීම යන මූලික කරුණුවලින් හතරක් දක්වා තිබීම. (ල. 2)

(ii) මාධ්‍ය සංදේශ ආධිපත්‍යය යනු සමාජ සංස්කෘතික වටිනාකම් හා චින්තනය කෙරෙහි බලපවත්නා මාධ්‍ය බලයයි. පුවත්පත් සඟරා, ගුවන් විදුලිය, රූපවාහිනිය, අන්තර්ජාලය ආදිය මෙලෙස ආධිපත්‍ය දරන මාධ්‍ය ලෙස දැක්විය හැකිය. රූපවාහිනිය තුළ පවත්නා ආධිපත්‍යයික ස්වරූපය ප්‍රබලය. ව්‍යාපාරික පාර්ශව විසින් ඒවා මෙහෙයවීම ඔවුන්ගේ මතවාද මාධ්‍ය සංදේශ තුළ සැඟවී තිබීම. ආදී වශයෙන් දක්වා තිබීම අවශ්‍යය.(ල. 4)

(iii) විෂය නිර්දේශයේ 6.2.2 මාධ්‍ය සහ විවිධ දෘෂ්ටිවාද යන කොටස ඇසුරින් මනෝ විශ්ලේෂණවාදී විචාරය සහ ස්ත්‍රීවාදී විචාරය විස්තර කර තිබීම අවශ්‍යය. (ල. 6)

(iv) * අති විශාල ජන පිරිසක් එකවර ඉලක්ක කරගනිමින් තොරතුරු බෙදා හැරීම.
* සංදේශය පොදුය, අන්තර්ගතය විවෘතය.
* සංකීර්ණ විධිමත් ආයතනික රටාවක් පෙන්වයි.
* තෘතිය සන්නිවේදකයන් හා යාන්ත්‍රික මාධ්‍ය භාවිතා කරයි.
* දියුණු තාක්ෂණයක් සහ අධික පිරිවැයක් සහිත ක්‍රියාවලියකි. ආදි වශයෙන් කරුණු 04ක් දක්වා තිබීම සහ විස්තර කර තිබීම අවශ්‍යය. (ල. 8)

(එකතුව = 20)